**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය - 2016**

---------------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ("කාර්යාංශය") මූල්‍ය ප්‍රකාශන සහ කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

### (අ) තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### (ආ) තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

කාර්යාංශයේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයක් වන සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගෙන තිබුණි. පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය නොකළ විගණන මතයක් 2018 අප්‍රේල් 03 දින මා විසින් ප්‍රකාශ කරන ලදී.

සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විකුණුම් පිරිවැය හා අදාළ උපලේඛනවල දැක්වෙන අනුරූපී වටිනාකම් අතර එකතුව රු.555,548 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

## 2.3 කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

කාර්යාංශයේ උපදේශක අංශයේ අභ්‍යන්තර කාර්යයන්ට අදාළව උපදේශක ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු වෙනුවට මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂය සඳහා උපදේශක ආදායම රු.10,003,303 කින් අඩුවෙන් දැක්වුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 20 ක් සම්පූර්ණයෙන් නිම කර තිබූ නමුත් එම ව්‍යාපෘතිවලට අදාළව එකතුව රු.56,657,977 ක් වූ අයකර නොගත් වැඩ පූර්ව අත්තිකාරම් ගිණුම්වල පැවතුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් කොන්දේසිවල 03 වගන්තිය හා එවකට ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය විසින් නිකුත් කරන ලද අංක

අයිසීටීඒඩී/එස්බීඩී/02 දරන සම්මත ලංසු ලියකියවිලිවල 14.2 (ආ) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය සියයට 90 ක නිමකිරීම් අදියරට ළඟා වීමට පෙර වැඩපූර්ව අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර ගත යුතුය.

(ආ) උතුරු මූලස්ථාන කාර්යාලයට අදාළව රු.23,747,725 ක් හා රු.2,733,200 ක් වූ බැර ශේෂයන් පිළිවෙලින් රඳවාගැනීම් මුදල් ශේෂයන් හා ලැබිය යුතු වැඩ පූර්ව අත්තිකාරම් වලට එරෙහිව නිරවුල් කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රඳවාගැනීම් මුදල් හා ලැබිය යුතු වැඩපූර්ව අත්තිකාරම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඌව මූලස්ථාන කාර්යාලයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයට අදාළව අසාමාන්‍ය හර හා බැර ශේෂයන් පිළිවෙලින් රු.4,974,379 ක් හා රු.5,338,969 ක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පිළිවෙලින් ණයහිමි හා ණයගැති ශේෂයන්වල ඇතුළත් කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයහිමි හා ණයගැති ශේෂයන් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් මාසයේදී කරාපිටිය මහ රෝහල සඳහා උපදේශක ව්‍යාපෘතියක (අංක C 802 – 40 දරන) උපදේශක ආදායම වෙනුවෙන් ගෙවන ලද රු.21,853,962 ක මුදලක් 2016 වර්ෂය සඳහා ආදායම ලෙස සාවද්‍යව මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවල වාර්තා කරන ලද පරිදි, 2012 වර්ෂයේ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 3,601 ක් වටිනා වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් කාර්යාංශයට ලැබී තිබුණි. කෙසේ වුවද එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී කාර්යාංශයට ගෙවිය යුතු කොන්ත්‍රාත් ගෙවීමක් ලෙස ඉන් රු.මිලියන 250 ක මුදලක් අයකර ගෙන තිබුණි. තවද එම වත්කම් පිළිබඳ කිසිදු වෘත්තීමය තක්සේරුවක් සිදුකිරීමෙන් තොරව සහ රු.මිලියන 3,351 ක ප්‍රදානය නොසලකා කාර්යාංශය විසින් එය රු.මිලියන 250 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,554,283 ක් වූ විවිධ ණයගැතියන් සඳහා විස්තරාත්මක උපලේඛන, සබරගමුව, උතුරු මැද හා උතුරු පළාත්වල මූලස්ථාන කාර්යාල 3 විසින් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලස්ථාන කාර්යාල 10 ක ව්‍යාපෘති 249 කට අදාළව රු.727,952,222 ක් වූ ණයගැති ශේෂ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණු අතර 2017 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) රු.2,710,426 ක් වූ අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව හිඟ හිට පැවතුණු අතර 2017 දෙසැම්බර් 31 වන විටත් එම ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති 95 කට අදාළව රු.162,604,471 ක හිඟ හිටි ණයගැති ශේෂය කාර්යාංශයේ උපදේශක අංශය විසින් විගණන දිනය වූ 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2004 ඔක්තෝබර් 07 දිනැති අංක සීබී/එෆ්අයිඑන්/ඒ-1278 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ විධිවිධාන අනුව මුදල් අත්තිකාරම් දින 14 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, කාර්යාංශයේ විශේෂ ව්‍යාපෘති ඒකකයේ කිසිඳු වියදමක් දැරීමෙන් තොරව මාසයකට පසුව අත්තිකාරම් නිරවුල් කර තිබුණි. තවද, නිලධාරීන් දෙදෙනෙකු වර්ෂ 2 ½ ක කාලපරිච්ඡේදය තුළදී ලබාගත් මුදල් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.815,819,952 ක හා රු.926,043,990 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.582,045,143 ක් හා රු.699,657,689 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.233,774,809 ක් හා රු.226,386,301 ක් හෙවත් සියයට 40.1 ක හා සියයට 32.35 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ හා සමූහයේ උපදේශක ආදායම, වෙනත් ආදායම හා මූල්‍ය ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 ලාභදායීත්වය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවකයන් 1,350 කින් සමන්විත එහි කාර්ය මණ්ඩලය හා රු.මිලියන 18,433 ක මුළු වත්කම් පදනම උපයෝජනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාංශය විසින් රු.මිලියන 815 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණි. එබැවින් ලාභය, කාර්යාංශයේ මුළු වත්කම්වලින් සියයට 4.42 කින් නියෝජනය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 11.16 ක් හා සියයට 7.89 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ලාභ ආන්තික පිළිවෙලින් සියයට 0.61 කින් සුළු වශයෙන් අඩු වී හා සියයට 2.46 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

කර්මාන්ත අප ජලය පරීක්ෂණ, පරීක්ෂණ හා විශ්ලේෂණාත්මක කාර්යයන්, විනාශකාරක නොවන කොන්ක්‍රීට් පරීක්ෂණ ක්‍රමය වැනි කාර්යයන්ට අදාළව සකස් කරන ලද ඉලක්ක ඉටුකර ගැනීම සඳහා උපදේශක අංශය හා ඉදිකිරීම් අංශය කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අසමත් වී තිබුණි.

### 4.2 නිෂ්කාර්ය බැංකු ශේෂ

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාලදිවයින් සුනාමි ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවය 2014 ජූලි මාසයේදී සම්පූර්ණයෙන් නිමකර තිබුණද, මාලදිවයින් බැංකුවේ පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුමේ රු.8,047,501 (MVR 856,016.91) ක ශේෂයක් කිසිදු කාර්යයකට යොදාගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) කාර්යාංශයේ ජාත්‍යන්තර අංශය විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම් 3 ක රු.2,514,979 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවකට යොදාගැනීමෙන් තොරව පැවතුණි.

### 4.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

2014 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා රු.75,000 ක මාසික දීමනාවක් සහිතව කාර්ය පැවරුම් පදනම මත උපදේශකවරයකු පත්කර තිබුණි. මෙම පත්කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ කාර්යාංශය සඳහා බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියක් (SOR) පිළියෙල කිරීමයි. කෙසේ වුවද පැවරුම් කාලපරිච්ඡේදය තුළදී එය පිළියෙල කර නොතිබුණි. පසුව, කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය 2016 දෙසැම්බර් 07 දක්වා දීර්ඝ කර තිබූ අතර එම කාලපරිච්ඡේදය සඳහා රු.100,000 ක මාසික දීමනාවක් ගෙවා තිබුණි.

### 4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශය විසින් ජාතිය ගොඩනැගීමේ බදු (NBT) හා එකතු කළ අගය මත බදු (VAT) මුදල් පදනම මත ගෙවනු ලැබේ. කෙසේ වුවද මුදල් පදනම මත මෙම බදු ගෙවීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය 2016 වර්ෂය අවසාන වන විටත් කාර්යාංශයට ලැබී නොතිබුණි.

(ආ) කොළඹ 07 සරණ පාර පිහිටි නිල නිවාස පසුගිය වර්ෂ 3 සිට 13 දක්වා කාලය තුළ පිටස්තර පාර්ශවයන්ට කාර්යාංශය විසින් භාර දී තිබුණි. කෙසේ වුවද කිසිදු කුලියක් එම පාර්ශවයන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි. තවද එම නිවාසවල විදුලිය හා ජල ගාස්තුද පදිංචිකරුවන්ගෙන් අයකර ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි සේවකයන්ට දිරි දීමනා යෝජනා ක්‍රම කිහිපයක් අනුමත කර තිබුණි. 2016 වර්ෂය තුලදී එසේ ගෙවන ලද මුළු දිරි දීමනා මුදල රු.391,732,587 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම්, විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන කාර්යාංශය විසින් 2017 ඔක්තෝබර් 16 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. තවද, 2016 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 පෙබරවාරි 23 දින දීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කාර්යාංශයේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් | අදාළ පාර්ශවයන්ගෙන් සනාථ කිරීමෙන් තොරව ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ වර්ෂ 04 කට වැඩි කාලයක් පැවතුණි. |
| (ආ) | වත්කම් කළමනාකරණය | මාර්ග ව්‍යාපෘති සඳහා එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු වත්කම් සාධාරණ ලෙස අගය කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |
| (ඇ) | ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය | වැඩ බිමේ තිබූ ඉන්වෙන්ට්‍රි හා ආපසු යැවිය යුතු තොග අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |
| (ඈ) | ගිණුම්කරණය | උපදේශක අංශයේ අභ්‍යන්තර කාර්යයන්වලට අදාළ තථ්‍ය වැඩ නිමකිරීම් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |